වී. ඔසියේයෙවා


# නිල් පාට කොළ



වී ඔසියේයෙවා

# නිල් පාට කොළ

සී/ස, ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්) සමාගම



## හොඳ වැඩ

යූරික් උදේ පාන්දර නැගිටලා වටපිට බැලුවා. බොහොම හොඳට ඉර පායලා තියෙනවා. හොඳ දවසක්. හොඳ වැඩක් කරන්න ඕනයි කියලා යූරික් සිතුවා.

"මගේ නංගී ගඟේ ගිලුනානම් මම එයාව බේරා ගන්නවා!"

නංගී ළඟට ඇවිත් යූරික්ට කතා කළාː

"අනේ අයියේ එන්නකෝ මාත් එක්ක ඇවිදින්න යන්න"

"පලයන්, පලයන් නුඹ කල්පනා කිරීමට ඉඩ දෙන්නේ නැහැ"

නංගී අඬ අඬා යන්න ගියා.

යූරික් ආයෙමත් කල්පනා කරනවා.

"වෘකයෝ අපේ කුස්සි අම්මාව හපා කන්න ආවා නම් මම උන්ට වෙඩි තියනවා."

කුස්සි අම්මා යූරික් ළඟට ඇවිත් කතා කළා:

"යූරික්, පිඟාන රාක්කය උඩින් තියන්න."

"මට බැහැ. මම කල්පනා කරනවා."

කුස්සි අම්මා හිස වනලා යන්න ගියා. යූරික් ආයෙමත් කල්පනා කරනවා.



"ඔන්න, අපේ බල්ලා ළිඳට වැටුණා නම්, මම ඌව ගොඩ ගන්නවා"

බල්ලා යූරික් ළඟට ඇවිත් වලිගය නටවලා බීමට වතුර ටිකක් ඉල්ලුවා.

"පලයන් යන්න, කල්පනා කිරීමට මට ඉඩ දීපන්!"

බල්ලා එක පාරක් බුරලා යන්න ගියා.

යූරික් අම්මා ළඟට ගිහිල්ලා මෙහෙම කීවා: "අම්මේ හොඳ වැඩ කිරීමට මා කැමතියි. හොඳ වැඩ කරන්නේ කොහොම ද?"

අම්මා යූරික්ගේ හිස අත ගාලා මෙහෙම කිව්වා.

"එහෙම නම් නංගීත් එක්ක ඇවිදින්න යන්න. කුස්සි අම්මාට උදව් වෙන්න. බල්ලාට වතුර දෙන්න."



## බල්ලා කාගෙද?

කෝල්යා සහ වාන්යා හොඳ යාළුවෝ. දවසක් දා මේ දෙදෙනාට ලොකු බල්ලෙක් හමු වුණා. උගේ කකුලක් තුවාල වෙලා තිබුණා. දෙදෙනාම එකතු වෙලා උගේ කකුලට බෙහෙත් කළා. උගේ නම ලපයා. එක දවසකින් ලපයා සනීප වුණා. යාළුවෝ දෙදෙනාටම ඕන වුණා බල්ලාව තනිකර අයිති කර ගැනීමට. එහෙත් දෙදෙනාටම මෙය විසඳා ගැනීමට බැරි වුණා. දෙදෙනාම සණ්ඩු කර ගත්තා.

දවසක් දා මේ දෙදෙනා ලපයාත් සමග ඇවිදින්නට ගියා. කෝල්යා කීවා ලපයා එයාගෙ කියලා. වාන්යා කීවා ලපයා එයාගෙ කියලා.

කෝල්යා කීවා: "ඉස්සෙල්ලාම බල්ලාව දැක්කෙ මම. උඹට අඬ ගැහුවෙ මම"



"නැහැ. මම තමයි උගේ කකුලට බෙහෙත් බැන්දෙ. උෟට රස කෑම ගෙනාවෙ" කියලා වාන්යා කීවා.

දෙදෙනම තමන්ගේ අයිතිය කියමින් ආයෙමත් සණ්ඩු කළා.

"ලපයා මගේ! ලපයා මගේ!" දෙදෙනාම කෑ ගැසුවා.

එතකොට කැලෑවෙ ඉඳලා දඩයම් බල්ලො දෙදෙනෙක් ඇවිත් ලපයාව හපා කන්න පටන් ගත්තා. වාන්යා බයවෙලා ගහකට නැගලා කෑ ගැහැව්වා.

"බේරියන්! පැනලා දුවපන්!"

කෝල්යා ලොකු කෝටුවක් හොයා ගෙන දඩයම් බල්ලන්ට ගැහැව්වා. ශබ්දය ඇහිලා කැලෑවේ හිටිය දඩයක්කාරයෝ ආවා. ඒ ගොල්ලො දඩයම් බල්ලන්ව අල්ලා ගත්තා.

"කාගෙද මේ බල්ලා!" දඩයක්කාරයෙක් ඇසුවා.

"මගේ" කෝල්යා කිව්වා.

වාන්යා නිහඬව හිටියා.



# පොල්කිච්චෝ

පොල්කිච්චෝ තුන් දෙනෙක් රූස්ස ගහක අත්තක ඉඳගෙන කීච් බීච් ගාලා සද්ද කරන්න පටන් ගත්තා. රූස්ස ගහ පොල්කිච්චන්ට කතා කරලා මෙහෙම කිව්වා.

"පොල්කිච්චනි! අන්න අතන තියෙන දිය කඩිත්තට පලයල්ලා"

පොල්කිච්චෝ එතැනට ඉගිලිලා ගියා. දිය කඩිත්ත ළඟ තණ පෙත්තොයි, පළගැටියොයි හඬ නැගුවා. එතකොට මල් හිස වැනුවා. පොල්කිච්චො කීච් බීච් ගාලා ආයෙමත් සද්ද කරන්න පටන් ගත්තා. මේ සද්දෙ හන්දා මල් හිස පාත් කර ගත්තා. මහලු මී මැස්සෙක් කරදරකාරී පොල්කිච්චන්ට මෙහෙම කීවා.

"පොල්කිච්චනි! නුඹලාට නරකද අන්න අතන තියන පඳුරු ළඟට ගියාම!"

පොල්කිච්චෝ පඳුරු ළඟට ඉගිලී ගියා. එතැන සීත කාලෙ ගත කරන්න නොයෙක් රටවලට ගිය කුරුල්ලො තමන් දුටු දේ



ගැන යාළුවන්ට විස්තර කළා. අනිත් කුරුල්ලෝ බොහොම ආසාවෙන් අහගෙන හිටියා.

පොල්කිච්චෝ ආයෙමත් පාරක් කීච් බීච් ගාලා සද්ද කරන්න පටන් ගත්තා. හාවුන්ට හිසේ කැක්කුම හැදුනා. වෘකයාගේ කන් බිහිරි වුණා. ලේන්නු පොල්කිච්චන්ට කොට්ටන් ඇටවලින් ගැහුවා. හිවලා පොල්කිච්චන්ට කතා කරලා මෙහෙම කිව්වා.

"පොල්කිච්චනි, නුඹලා නගරයට පලයල්ලා!"

පොල්කිච්චෝ නගරයට පියාඹා ගිහිල්ලා ගෙයක වහලක් උඩ වැහැව්වා. ඒ ගෙදර ඉස්තෝප්පුවේ ගෑනු ළමයි තුන් දෙනෙක් වාඩි වෙලා මහ හයියෙන් කෑ ගසමින් කතා කළා. එක ළමයෙක් අනෙක් ළමයාට කතා කරන්න ඉඩ දෙන්නේ නැහැ. කෑ ගහනවා. අනිත් ළමයා දෙදෙනාටම වඩා හයියෙන් කෑ ගහනවා.

"ඔන්න අපට කියාපු තැන" පොල්කිච්චෝ සන්තෝෂ වුණා.

ඒ පාර නම් පොල්කිච්චන්ව එළවන්න කවුරුවත් ආවේ නැහැ. උන් පුරුදු පරිදි කීච් ගාලා කෑ ගහන්න පටන් ගත්තා. ගෑනු ළමයි උන්ගේ සද්දය ගණනකටවත් නොගෙන මහ හඬින් කෑ ගසමින් කතා කළා. මේ කෑගැසීම හන්දා පොල්කිච්චන්ගේ කන් බිහිරි වුණා.

"මේ ගෑනු ළමයි කෑ ගහන හැටි ඇහෙන කොට හිසේ ඇම්ම හැදෙනවා. මා කතා කරන දේ මටම ඇහෙන්නේ නැහැ" කියලා පොල්කිච්චෝ තුන් දෙනා ඉගිලී ගියා.



## පුත්තු තුන්දෙනා

ගැහැනු දෙදෙනෙක් වතුර ගේන්න ළිඳ ළඟට ගියා. තවත් ගෑහැනියක් එතැනට ආවා. මහලු මිනිහෙක් ළිඳ ළඟ වාඩි වෙලා විවේක ගනිමින් හිටියා.

එක ගැහැනියක් තම පුතා ගැන මෙහෙම කීවා.

"මගේ පුතා හරිම හපනෙක්. උඩ පිනුම් ගහනවා. දුවනවා බොහොම හයිය ඇති ළමයෙක්."

"මගේ පුතා සින්දු කියනවා. එයාගෙ කටහඬ සැළලිහිණියකුගෙ වගෙයි. බොහොම ලස්සනයි" කියලා තවත් ගැහැනියක් කීවා.

"නුඹ නිහඬව ඉන්නේ ඇයි? නුඹේ පුතා ගැනත් කියපන්" ගැහැනු දෙදෙනා අනිත් එකියගෙන් ඉල්ලා හිටියා.



"මගේ පුතා ගැන කියන්න තරම් දෙයක් නැහැ"

තුන්දෙනා ම බාල්දිවලට වතුර පුරවාගෙන ගෙදර යන්න පිටත් වුණා. මහල්ලත් ඔවුන් පිටුපසින් ගමන් කළා. ගැහැනු තුන්දෙනාගේ ම අත් රිදෙන්නට පටන් ගත්තා. වතුර බාල්දිවල බර හන්දා පිටකොන්ද කකියන්නට පටන් ගත්තා.

පුත්තු තුන්දෙනා ම ඉදිරියට දුවගෙන ආවා.

එක පුතෙක් උඩ පැනලා පිම්මක් ගහලා වේගයෙන් දුවලා ගියා.

අනිත් පුතා බොහොම ලස්සනට ගීතයක් ගායනා කළා.

තුන්වෙනි පුතා අම්මා ළඟට ඇවිත් ඈ ගෙන ගිය වතුර බාල්දි දෙක දෑතින් අරගෙන ගෙදර ගියා.

ගෑනු මහල්ලාගෙන් ප්‍රශ්න කළා.

"කොහොමද අපේ පුතුන්ගේ හැටි?"

"කොහෙද ඒගොල්ල? මා දැක්කේ අම්මාට උදව් කළ පුතා විතරයි" මහල්ලා කීවා.



## කෑදර ළමයා

කාත්යා ළඟ කොළපාට පැන්සල් දෙකක් තිබුණා. යෙලේනා ළඟ කොළපාට එක පැන්සලක්වත් තිබුණේ නැහැ.

යෙලේනා කාත්යාට මෙහෙම කීවා.

"කොළපාට පැන්සලය ටිකකට දෙන්න."

"අපේ අම්මාගෙන් අහලා දෙන්නම්" කියලා කාත්යා පිළිතුරු දුන්නා.

පහුවදා දෙදෙනාම පාසලට ආවා. යෙලේනා ආයෙමත් ඇහුවා:

"අම්මා අවසර දුන්න ද?"

"අම්මා අවසර දුන්නා, නමුත් අයියාගෙන් අහන්න බැරි වුණා" කියලා කාත්යා පිළිතුරු දුන්නා.

"හොඳයි අයියාගෙන් අහන්න" කියලා යෙලේනා කීවා.

ඊට පහුවදා යෙලේනා කාත්යාගෙන් කොළපාට පැන්සලය ඉල්ලුවා.



"අයියා අවසර දුන්නද?"

"අයියා අවසර දුන්නා, නමුත් නුඹ පැන්සලය කඩයි කියල මට බයයි" කාත්යා කීවා.

"මම බොහොම ප්‍රවේසමෙන් පාට කරන්නම්" යෙලේනා කීවා.

"ප්‍රවේසමෙන් පාට කරපන්. පැන්සලය කඩන්න එපා. කටේ දාන්න එපා. වැඩිය පාට කරන්න එපා" කාත්යා යෙලේනාට කීවා.

"මම ගහක් ඇන්දා. ගහේ කොළ පාට කරන්න ඕන." යෙලේනා කීවා.

"අපෝ බැහැ එච්චර ගොඩක් කොළ පාට කරන්න දෙන්න බැහැ" කාත්යා තරහෙන් වගේ බුම්මාගෙන කීවා.

යෙලේනා ඇය දිහා බලා යන්න ගියා. ඇගේ පැන්සලය යෙලේනා ගත්තේ නැහැ. කාත්යා යෙලේනා පස්සේ දුවලා ගියා.

"නුඹට මක්වෙලා ද? පැන්සලය ඕන ද?"

"මට එපා" යෙලේනා කීවා.

ඇඳීම පාඩම වෙලාවේ දී ගුරුතුමා යෙලේනාගේ පොත අතට අරගෙන බැලුවා.

"යෙලේනා ඇඳපු ගහේ කොළ නිල්පාට වුණේ කොහොමද?" ගුරුතුමා ඇසුවා.

"මා ළඟ කොළපාට පැන්සලක් තිබුණේ නැහැ."

"ඇයි ළඟ ඉන්න ළමයාගෙන් ඉල්ලුවේ නැත්තේ?"

යෙලේනා නිහඬව හිටියා. කාත්යාගේ මූණ ලැජ්ජාවෙන් රතු වුණා.

"යෙලේනාට පැන්සලය දීමට මා කැමතියි. එයා ගත්තේ නැහැ." කාත්යා කීවා.

ගුරුතුමා ළමයින් දිහා බැලුවා.

"යමක් දෙන්න ඕන, එය බාර ගන්න පුළුවන් වෙන විදිහටයි." ගුරුතුමා කීවා.



## පුරසාරම් කීම

එකෝමත් එක කැලෑවක හාවෙක් වාසය කළා. උගේ ඇගේ මයිල් පුළුන් වගේ. කන් බොහොම දිගයි. උෟ නිතරම පුරසාරම් කියනවා. එතරම් පුරසාරම් කියන හාවෙක් එම කැලෑවෙම හිටියේ නැහැ. හාවො එකතු වෙලා ගස් කොටවලට උඩින් පැන පැන සෙල්ලම් කරන විට, පුරසාරම් දොඩවන හාවා එතැනට එනවා.

"අපොයි, ඕකත් වැඩක් ද,මට පුළුවනි ලොකු ගහකට උඩින් පනින්න!" උෟ කියනවා.

කොට්ටන් ඇට උඩ විසි කරමින් හාවො සෙල්ලම් කරන විට පුරසාරම්කාරයා එතැනට යනවා.



"අපොයි, ඕකත් වැඩක් ද, මට පුළුවනි අහසෙ පාවෙන වළාකුළකට වැදෙන්න උඩ විසි කරන්න" කියලා ඌ කියනවා.

අනිත් හාවෝ ඌට සරදම් කරනවා.

"බොරු පුරසාරම් කාරයා!"

දවසක් දා කැලෑවට දඩයම් කාරයෙක් ඇවිල්ලා පුරසාරම් හාවා ගෙදර ගෙනියලා උගේ හම ගලවලා හිම කාලෙට පළඳින්න හිම තොප්පියක් හැදුවා. දඩයම් කාරයා තමන්ගේ පුතාට හිම තොප්පිය දුන්නා. ඒක හිසේ දාගත්තු හැටියෙම ඒ ළමයාත් හාවා වගේ පුරසාරම් දොඩවන්න පටන් ගත්තා.

"ගුරුතුමාට වඩා හොඳට මට ගණන් හදන්න පුළුවනි! ඕනම පොතක් එක පාරින්ම පාඩම් කරන්න පුළුවනි" දඩයම් කාරයාගේ පුතා කීවා.

"බොරු පුරසාරම්කාරයා!" අනිත් ළමයි ඔහුට කීවා.

පාසලට ඇවිල්ලා හිම තොප්පිය ගළවපු හැටියෙම දඩයම් කාරයාගේ පුතාට ලැජ්ජා සිතුණා.

"මට මක්වෙලා ද? හිටි හැටියෙම මම පුරසාරම් දොඩවන්නෙ ඇයි?" කියලා ඔහු කල්පනා කළා.

පාසල ඉවර වෙලා ගෙදර යනකොට ආපහු හිම තොප්පිය හිසේ දා ගත්තු හැටියෙම ඔහු පුරසාරම් දොඩවන්න පටන් ගත්තා.

"පොකුණේ ඒ පැත්තෙ ඉඳලා මේ පැත්තට මට පනින්න පුළුවනි!" ඔහු කීවා.

හිම ගොඩක හිම යානා පදිනකොට ඔහුගේ තොප්පිය බිම වැටුණා. තොප්පිය සෙව්වා, සෙව්වා නමුත් සොයාගන්න බැරි වුණා. ඔහු ගෙදර ගියා.

පහුවදා පුංචි ගෑනු ළමයි කට්ටියක් දර එකතු කරන්න කැලෑවට ගියා. එක ළමයෙක් හිම ගොඩේ තිබුණු තොප්පිය අරගෙන ඒක හිසේ දමා ගත්තා. එකවර ම එයා ආඩම්බර වෙලා පුරසාරම් කියන්න පටන් ගත්තා.

"මොකට ද මම නුඹලා සමග එකට කැලෑවට යන්නෙ. මට තනියම දර ගොඩක් එකතු කරගෙන ඉක්මනට ගෙදර යන්න පුළුවනි."

"එහෙනම් තනියම පලයන්. පුරසාරම්කාරි"

අනිත් ළමයි එකතු වෙලා යන්න ගියා.


"නුඹලා නැතුවට මට තනියම පුළුවනි. ලොකු ගහක් උදුරල ගෙදර ගෙනියන්න මට පුළුවනි."

තොප්පිය පුරා හිම හන්දා, හිම ගසා දැමීමට තොප්පිය ගැලවුවා විතරයි ඈ බය වුණා.

"අයියෝ, කැලෑවේ මම තනිවම දර කඩන්නෙ කොහොමද? ආපහු ගෙදර යන පාර හොයාගන්නත් දන්නේ නැහැ. තනිවම දර හොයා ගන්නත් බැහැ!"

ළමයා තොප්පිය වීසි කරලා ළමයි කාණ්ඩය හොයන්න දුවලා ගියා. හා හමින් කළ හිම තොප්පිය පඳුරක් යට තිබුණා. ඒ පඳුර ළඟින් ගිය කෙනෙක් තොප්පිය අරගෙන හිසේ දමා ගත්තා. එවිටම ඔහු පුරසාරම් කියන්න පටන් ගත්තා.

වට පිට බලන්න, ඔය වගේ හිම තොප්පි ඇඳගත්ත ළමයින් ඉන්නවාද කියල.



# නිල්පාට කොළ

**වී. ඔසියේයෙවා**

අනුවාදය
දැදිගම වී. රුද්රිගු

ISBN 978-955-1319-83-0


මුද්‍රණය

ප්‍රකාශනය

**සී/ස, ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්.) සමාගම**
91, ආචාර්ය අන්.ඇම්. පෙරේරා මාවත, කොළඹ 08


ප්‍රථම මුද්‍රණය 2019

















ISBN 978-955-1319-83-0

9 789551 319830

සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

Rs. 200/-